# මව්වරු විදේශ රැකියා සඳහා යොමුවීම මත ඔවුන්ගේ දරුවන්ගේ අධ්‍යාපනික තත්ත්වය

**අයි. පී. හෂිනි සමුද්‍රිකා**[1]

## සංක්ෂේපය

අතීතයේ මව විසින් සිය දරුවන්ට සමාජ  සිරිත් විරිත් නීති රීති අධ්‍යාපනය ලබා දුන් අතර වර්තමානය වන විට, නොයෙකුත් හේතු කාරණා හමුවේ ඒවැනි දේ දුරස්ව යමින් පවතියි. බොහෝ මව්වරු විදේශ ගත වීමට වැඩි නැඹුරුතාවයක් දක්නට ලැබේ. අධ්‍යාපනය යනු, පොත්පත් වල ඇති දැනුම පමණක් නොව දරුවන්ට සිරිත් විරිත් හැදියාව පිළිබඳ දැනුම ද අත්‍යාවශ්‍ය වේ. එය පිරිපුන් දරුවෙක් නිර්මාණයට  අත්‍යාවශ්‍ය වේ. ඊට මූලිකව ම දරුවා සමජානුයෝජනය වන්නේ පවුල තුළිනි. නමුත් මව විදේශගත වීමේදී දරුවන් නිවැරදි ලෙස සමාජානුයෝජනය  නොවන අතර මවක් විසින් ඉටුකළ යුතු කාර්යය අවාසනාවන්ත ලෙස මග හැරී යයි. ඒ අනුව, මව විදේශ ගත වීම දරුවන්ගේ අධ්‍යාපනයට කොතරම් බලපාන්නේද ද යන්න සොයා බැලීම මෙම පර්යේෂණයේ අරමුණයි. අධ්‍යයනය සඳහා වේයන්ගොඩ ප්‍රදේශය අවට එලෙස මව විදේශ ගත ව සිටින පවුල් 20 ක් තෝරා ගත් අතර සම්මුඛ සාකච්ඡා හා ප්‍රශ්නාවලි ක්‍රමය මගින් අවශ්‍ය දත්ත ලබා ගන්නා ලදී. සංඛ්‍යාත්මක විධික්‍රම යොදා ගෙන දත්ත විශ්ලේෂණය කරන ලදී. අධ්‍යයන නිගමනයන්ට අනුව බොහෝ දරුවන් උසස් අධ්‍යාපනයක් නොලැබූ අය බව හෙළිවිය. එය 75 % ක් පමණ විය. එහිදී 40% ක් පමණම අ.පො.ස. සා/පෙළ අසමත් වූ දරුවන් බව අනාවරණය වූ අතර 30%  ක් අ.පො.ස. උ/පෙළ අසමත් වූ බව අනාවරණය කර ගන්නා ලදී. මෙහිදි අනාවරණය වන කාරණයක් නම්, පවුල් පරිසරය තුළ දුගී බව අසරණ බව පියවරුන්ගෙන් පවුලට ලැබෙන දායකත්වය අඩු බව වැනි කාරණා හමුවේ දරුවන්ගේ පවුලේ අභිවෘද්ධිය දැකීමට කාන්තාවන් විදේශ ගත වන බවයි. අවසන් ප්‍රතිඵලය වන්නේ, දරුවන්ගේ අධ්‍යාපනය අහිමි වී යාමයි.

**මුඛ්‍ය පද :**  දරුවා, මව, සමාජානුයෝජනය

[1] ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, hasinisamudrika897@gmail.com